# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 886 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 25/05/2024 පැය 1800

## මාධ්‍ය නිවේදනය

**ගස් ඉදිරීවැටීම් හේතුවෙන් සිදුවිය හැකි අනතුරු වලක්වා ගැනීම සඳහා මහජනතාව දැනුවත් කිරීම - පොලිස් රථවාහන මූලස්ථානය.**

කොළඹ ප්‍රදේශයට මේ දිනවල පවතින වැසිබර කාලගුණ තත්ත්වය නිසා නගරයේ මාවත් වල ඇති ගස් ඉදිරී වැටීම් කිහිපයක් පසුගිය දින කිහිපය තුල වාර්ථා වූ අතර විශේෂයෙන් මේ දිනවල කොළඹ නගරයේ වෙසක් සිරි නැරඹීම සඳහා පැමිණෙන ජනතාව මේ පිළිබඳව විශේෂ අවධානයෙන් සිටින ලෙස දන්වා සිටින අතර ගස් සහිත ස්ථානවල සහ ගස් යට වාහන නවතා තැබීම මෙන්ම එවැනි ස්ථානවල වාහන නවතාගෙන ඒවා තුල රැඳී සිටීමෙන් වළකින ලෙස පොලිසිය මහජනතාවට දැනුම් දෙනු ලබයි.

වාහන වල සෙමින් ගමන්කරමින් වෙසක් සිරි නරඹන පිරිස්ද මේ පිළිබඳව අවධානය යොමුකල යුතු අතර කොළඹ නඟරයේ ප්‍රධාන වෙසක් කලාපයන් පැවැත්වන බෞද්ධාලෝක මාවත බොරැල්ල කනත්ත හංදියේ සිට තුන්මුල්ල මන්සන්ධිය දක්වාත්, පෙරහැර මාවත ජේම්ස් පීරිස් මාවත හන්දියේ සිට රොටුන්ඩා මන්සන්ධිය දක්වාත්, බේබෑක් පෙදෙස යන ප්‍රදේශවල වාහන ගමනා ගමනය සඳහා විවෘත නොකොට අද දින රාත්‍රී කාලයේ වසා තැබෙන අතර වෙසක් කලාප නැරඹීම සඳහා වාහන වලින් පැමිණෙන ජනතාව සුදුසු ස්ථානයක වාහන නතරකර පා ගමනින් එම ප්‍රදේශවල ගමන් කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**